

**කහතුඩුව ශ්‍රී නන්දරාම විහාරස්ථානයේ බුද්ධ ප්‍රතිමා වහන්සේ**

## ❊ උතුම් ඇත්ත හතර බුදු දහමේ හරයයි

*– පිටිදූවේ සිරිධම්ම හිමි*

සම්මා සම්බුදුවරයකුගේ සුවිශේෂ සොයා ගැනීම වන ආර්ය සත්‍ය සතර අවබෝධ කරගැනීමේ වැදගත්කම, දහමෙහි හරය වටහාගැනීමට බුදුසසුන තුළ තවමත් හැකියාව තිබෙන බව, ජනප්‍රිය ධර්ම කථික සහ ලේඛක හිමි නමක් බුදුසරණට මෙම ලිපිය සපයයි.

## ❊ නිරවුල් මනසක් සඳහා භාවනා

*– මාකොළ මංගල හිමි*

සමථ හා විදර්ශනා භාවනා වැඩීම – නිරවුල් මනසක් ඇතිකර ගැනීමට උපයෝගී වන අයුරු – භාවනාව තුළින් ලැබෙන මානසික ප්‍රබෝධය සහ නිරවුල් බව – ජීවිත සාර්ථකත්වයට හේතු වන අයුරු – රුහුණු විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයකු වන ලේඛක හිමිනමක් මෙම ලිපිය සපයයි.

## ❊ මිනිස් කුස සුසාන භූමියක් කර ගත යුතුද?

*– අරන්කැලේ ධම්මවිහාරී හිමි*

පව පිළිකුල් කරන – දයාව, කරුණාව අගය කරන, දහමක් පිළිපැදීමට වෙර දරන බොදුනුවන් – හිංසා කොට හෝ බලහත්කාරයෙන් ලබාගත් සත්ව මාංශ අනුභව කිරීමේ නුසුදුසුකම.

## ❊ ආගම දහම සමග ස්වාභාවික පරිසරයෙන්ද දිවි පැවැත්ම සාර්ථක වේ

*– මහාචාර්ය මීගොඩ පඤ්ඤාලෝක හිමි*

සත්‍යාවබෝධයට සහ ධාර්මික දිවි පැවැත්මකට රුකුල් දෙන ස්වභාවික පරිසරය ඇසුරු කිරීම – එය සංරක්ෂණය හා ඒ පිළිබඳ ඇති කරගන්නා නිවැරැදි අවබෝධයෙහි වැදගත්කම. දහම් කරුණුවල අරුත් පැහැදිලි කිරීමෙහි සුවිශේෂ කුසලතාවක් ඇති – ප්‍රකට ධර්ම කථික හා ලේඛක හිමිනමකි, මෙම ලිපිය සපයන්නේ.

## ❊ දස පුණ්‍ය ක්‍රියා සිදුකර ගත හැකි වස් කාලය

*– කැටවල ඉන්දසාර හිමි*

වස් විසීමේ ශාසනික සම්ප්‍රදායෙහි වැදගත්කම – වස් කාලය තුළ ගිහි – පැවිදි දෙපාර්ශ්වයටම කුසල ප්‍රතිපදාවෙහි නියැළීමටත් – පින්කම් සිදුකර ගැනීමටත් පවතින සුවිශේෂ අවස්ථාව.

## ❊ බොරෝ බුදුර් විහාර හා ස්ථූප සංකීර්ණය

ඉන්දුනීසියාවේ මධ්‍යම ජාවා ප්‍රදේශයේ පිහිටි විශ්මය උපදවන නිර්මාණයක් ලෙස ලොව පතළ බෞද්ධ ආගමික සිද්ධස්ථානයක් පිළිබඳ තොරතුරු හෙළිකරන ලිපියකි.

## ❊ බෞද්ධ අධ්‍යාපනයේ සුවිශේෂත්වය

*– ලියන්වෙල සිරිසුනන්ද හිමි*

පුද්ගල විමුක්තිය, පුද්ගල පෞරුෂ සංවර්ධනය සහ සමාජ සංවර්ධනය අරමුණු කොටගත් බෞද්ධ අධ්‍යාපනයේ විශේෂත්වය. සත්‍යය වටහා ගැනීම සඳහා බෞද්ධ අධ්‍යාපන ක්‍රම තුළ දක්නට ලැබෙන සුවිශේෂ චින්තන රටාව.

## ❊ මල්වතු මහ නාහිමියන් සසුනට දයාද කළ තිබ්බටුවාවේ පරපුර

*– ඇස්.බී. කරල්ලියද්ද*

වර්තමාන මල්වතු මහ නාහිමියන් පැවිද්ද ලද සංඝ පරපුරෙහි – උන්වහන්සේගේ ආචාර්ය උපාධ්‍යාය පරපුරෙහි තොරතුරු සහ උන්වහන්සේ පැවිදි වීමට පෙර ගිහි ජීවිතයේ තොරතුරු ඇතුළත් ලිපියකි.

## ❊ නිවන තෙක් යන සසර ගමනේ සොඳුරු නැවතුම්පොළ බණ මඩුව.

*– සිසිර ජයනාත් පීරිස්*

දම් දෙසුම් සඳහා සිරිලක එදා සිට භාවිතා කළ දහම් හල – නැතහොත් පන්සලේ බණ මඩුවෙහි ඉතිහාස කතාව සහ නිර්මාණයක් වශයෙන් එහි ඇති අපූර්වත්වය.

## ❊ මෑණිවරුනි! ඔබටයි මේ ඇමතුම

*– ඩී.සී. පීරිස්*

දරුවන් ලැබූ සහ ලැබීමට නියමිතව සිටින මවුවරුනට වැදගත් ධර්මෝපදේශ ඇතුළත් ලිපියකි. තමන්ගේ දරුවා හෙට දිනයේ බිහිවන සදාචාරවත් සමාජයක වැදගත් සාමාජිකයකු බවට පත්කිරීම සඳහා මවකගේ දයකත්වය කෙබඳු විය යුතුද යන්න, පැහැදිලි කළ බුදුවදන් විමසීමකි.

## ❊ පන්සිල් සාර්ථක දිවියක පදනමයි.

*– කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි.*

සාර්ථක සමාජ ජීවිතයක් සඳහා පංචශීල ප්‍රතිපදාවෙහි වැදගත්කම. රජ පවුල්වල පුද්ගලයන් පවා දුස්සීලකම නිසා පරිහානියේ අගාධයට ඇද වැටුණු අන්දම ද නිදසුන් මගින් පෙන්වා දුන් කුඩා ලිපියකි. 'ධම්ම චින්තා' විශේෂාංගයට මේ ලිපි සපයන්නේ ශ්‍රී ලංකාවේ ජනප්‍රිය – විචිත්‍ර – ධර්ම කථික හිමි නමකි.

## ❊ රහතන් වහන්සේ පවා වැඩ වෙසෙතැ'යි සිතන තායි වන සෙනසුන්

*– ගාල්ලේ සංඝ සුභද්‍ර හිමි*

තායිලන්තයේ වර්තමානයේ පවතින බෞද්ධ ප්‍රබෝධය සහ තායිලන්ත වන සෙනසුන් පිළිබඳ තොරතුරු. විමුක්තිය සෙවීමට දැඩි උනන්දුවක් හා කැපවීමක් ඇති තායි ජාතික සුප්‍රකට හිමිවරු කිහිප නමක් පිළිබඳ තොරතුරු ද මෙම ලිපියට ඇතුළත් ය.

### ⁜ තරුණයිනි, සැනසුම ඇත්තේ දහම තුළයි.

*– ආචාර්ය සිරිපාල මාදුවගේ*

විවිධ විදේශික හා අන්‍යාගමික බලවේගවල බලපෑම මත නූතන සමාජය තුළ හඹා යන සංස්කෘතික වෙනස්කම් මත වැරැදි මඟ යමින් අසහනයට පත් වෙමින් සිටින නූතන තරුණ පරපුරට – දහම තුළින් ලද හැකි සැනසුම වටහා දීමට දරන ලද ප්‍රයත්නයකි.

### ⁜ අන්තවාදී නොවී ප්‍රතිචාර දක්වමු.

*– කතුවැකිය*

### ⁜ තමන් මට්ටු කරගන්නා පඬිවරු

*– දිවියාගහ යසස්සි නා හිමි*

සිත දියුණු කර ගැනීමෙන් මිනිසකුට ලද හැකි විශිෂ්ඨ ජීවිත ඵල දක්ෂ වඩුවන් ලී දඬු කපා තමන්ට උවමනා පරිදි ඒවා සකස් කරගන්නා ලෙස නිර්මාණශීලී බෞද්ධ චින්තකයාට – උත්සාහයෙන් තමන්ගේ සිතෙහි සුවිශේෂ වෙනස්කම් සිදුකර ගත හැකි අයුරු, විද්වත් ලේඛක හිමිනමක් විසින් 'සාර්ථක ජීවිතයකට ධම්ම පදයෙන්' විශේෂාංගය යටතේ ඉදිරිපත් කරන කුඩා ලිපියකි.

### ⁜ අනගාරික ධර්මපාල තුමා

*– හේමමාලා රත්දූනු*

ශ්‍රී ලාංකීය සමාජය සහ බුදුසසුන විදේශික ආක්‍රමණ නිසා පරිහානියට පත්වෙමින් තිබුණු යුගයක – බුදු සසුනේ පුනරුදයක් ඇති කළ බෞද්ධ නායකයකුගේ ජන්ම දින සමරුව නිමිත්තෙන් එතුමාට උපහාර වශයෙන් පළ වන විශේෂ ලිපියකි.

### ⁜ බෞද්ධ ප්‍රවෘත්ති කිහිපයකි.

### ⁜ 'පොදු අරමුදලක් පිහිටුවා අසරණ ජනතාවට සෙත සලසනවා'

නව මල්වතු මහ නාහිමියන් පිළිගැනීම සඳහා කුරුණෑගල රිදී විහාරයේ පැවැති උත්සවයකදී – උන්වහන්සේ ජනතාව අමතා කළ අනුශාසනාවකි.

### ⁜ Dialogues on Dhamma

*-Bogoda Premaratna Kumar de Silva*